ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

**11 ශ්‍රේණිය** | **බුද්ධ ධර්මය II** | **කාලය පැය දෙකයි.**

- **පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 කි. අනෙක් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ.**

---

01. i. බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් අසරණ සරණ ගුණය පිළිබිඹු වන අවස්ථා දෙකක් ලියන්න.
    ii. "සතිසම්පජඤ්ඤ" හා "සන්තුට්ඨිතා" යන ගුණාංග දෙකේ අර්ථය ලියන්න.
    iii. "සත්තසතිකා සංගීතිය" යනු කී වැනි සංගායනාව ද?එයට මුලිකත්වය ගත් තෙරුණ්වහන්සේ කවුරුන් ද?
    iv. මහනුවර යුගයේ චිත්‍රවල දක්නට ඇති විශේෂතා දෙකක් ලියන්න.
    v. "යේ ධම්මා හේතුප්පභවා ........" යන ගාථාව සම්පූර්ණ කරන්න.
    vi. ඉපදීම නිසා සත්ත්වයාට විදීමට සිදුවන දුක්ඛයන් දෙකක් නම් කරන්න.
    vii. "විනයෝ නාම සාසනස්ස ආයු" මෙම පාඨයේ අර්ථය ලියන්න.
    viii. ආගම් භේදයකින්, ජාති භේදයකින් තොරව අනුගමනය කළ හැකි බෞද්ධ ඉගැන්වීම් දෙකක් නම් කරන්න.
    ix. මහින්දාගමනයෙන් අපට ලැබුණු දායාද දෙකක් ලියන්න.
    x. ත්‍රිපිටකය සඳහා සිංහලෙන් ලියන ලද අටුවා ග්‍රන්ථ දෙකක නම් ලියන්න.

(ලකුණු 10 x 2 = 20 යි)

02. i. නතං කම්මං කතං සාධු ..... යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.
    ii. එම ගාථාවේ තේරුම ලියන්න.
    iii. අප කළයුතු නොකළ යුතු දෑ මොනවාදැයි ධම්මපද දේශනා ඇසුරින් පැහැදිලි කරන්න.

03. i. දස රාජ ධර්ම අතුරින් දෙකක් නම් කරන්න.
    ii. එම එක් ඉගැන්වීමක් කෙටියෙන් හඳුන්වන්න.
    iii. නායකයෙකු, පාලකයෙකු තුළ තිබිය යුතු යහපත් ගුණාංග මොනවාදැයි පැහැදිලි කරන්න.

04. i. "පටිච්චසමුප්පාද" යන යෙදුමෙන් කියවෙන අර්ථ දෙකක් ලියන්න.
    ii. බුදුරජාණන් වහන්සේ විසින් පටිච්චසමුප්පාද දේශනාව කිරීමේ අරමුණු මොනවා ද?
    iii. "එක්තරා නගරයක වෙළඳසැලක් හොරු කැඩුවෝ ය". එම සිදුවීම හේතුඵල ධර්මයට අනුව විග්‍රහ කොට දක්වන්න.

05. i. "විරමණය හා සමාදානය" යන වචනවල අර්ථය ලියන්න.
    ii. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස තුනක් ලියන්න.
    iii. සිල්වත් වීමෙන් පෞද්ගලික හා සමාජ යහපත ඇතිවන බව පෙන්වා දෙන්න.

06. i. මහින්දාගමනය යනු කුමක්දැයි දක්වන්න.
    ii. මහින්දාගමනයට පෙර මෙරට පැවති ඇදහිලි විශ්වාස තුනක් දක්වන්න.
    iii. මහින්දාගමනයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙරට ජනයා තුළ ගොඩ නැගුණු උසස් සාර්ධර්ම මොනවාදැයි පැහැදිලි කරන්න.

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.
    i. වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ තෙරණුවෝ.
    ii. සඳකඩ පහණ.
    iii. අනිත්‍ය ලක්ෂණය
    iv. විදර්ශනා භාවනාව

www.edudept.up.gov.lk